**2022 මැයි මස මාසික සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව**

**තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව**

**ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව**
**දිනය - 2022.05.17**
**වේලාව - පෙ.ව. 10.00**

**පැමිණීම -**

| | | |
|---|---|---|
| I. | ඩබ්ලිව්.ජී. උපුල් මහතා | - ගරු සභාපති |
| II. | විදාන ගමගේ සුදත් මහතා | - ගරු උප සභාපති |
| III. | පී.එල්. චාලි ගුණරත්න මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | කේ.එච්. ගාමිණී මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | හර්ෂ උදය කුමාර ජයවීර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | ඩබ්.කේ. ටෂිත සමිල මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VII. | ඒ.පී. ධම්මික මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VIII. | ආර්.රජිත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IX. | චතුමිණී විජේනායක මෙනවිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| X. | ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XI. | එම්.එල්.එම්. හනීෆා මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XII. | ආර්.කේ.එම්. රෝහිත මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIII. | පී.කේ. ආරියසේන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIV. | එන්.ජී. සරත් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XV. | වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVI. | චමින්ද ඩයස් වන්නිගේ මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVII. | ජී.එච්.ජී. නීටා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVIII. | ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIX. | වැල්ලගේ ජීවානි මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XX. | ඒ.ඩබ්. නන්දා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |

**නොපැමිණීම -**

| | | |
|---|---|---|
| I. | එල්.එච්. කුමුදු සුජීව මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| II. | කපිල ඉන්ද්‍රජිත් ශ්‍රීවර්ධන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| III. | ඩබ්.කේ. සිසිර කුමාර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා පංචසීලය සමාදන් වීමෙන් අනතුරුව, රට වෙනුවෙන් දිවිපිදූ විරෝධාර රණවිරුවන්ට, ප්‍රාදේශීය සභාවේ ධූර කාලය දරා, මේ වන විට මිය ගොස් ඇති බුද්ධදාස ජයසූරිය මහතා

ඇතුළු ගරු සභාපතිවරුන්ට, ගරු උප සභාපති ලෙස සිට මිය ගොස් ඇති ඩබ්.කේ. ප්‍රේමදාස මහතා හා අප සභාව නියෝජනය කළ ගරු සභික, එච්.ජේ.කේ.ජී. විජේරාම මහතාත්, ගරු සභිකවරුන් ඇතුළුව මියගිය සියලුම දෙනාට උපහාර දක්වමින්, විනාඩි දෙකක නිෂ්ශබ්දතාවය පළ කරන ලදී.

ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් 2022 වර්ෂයේ මැයි මස මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්, ලේකම්තුමිය, මාධ්‍යවේදී රංජිත් ඩයමන් මහතා, ඒ.ඒ. ප්‍රේමදාස මහතා ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) (i) 2022.04.08 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.04.08 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලෙස ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා යෝජනා කරන ලදී. 2022.04.08 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන බව ගරු ප්‍රාදේශීය සභා සභික ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **සංශෝධන**

I. **ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා**

2022.04.08 මහා සභා වාර්තාවේ පිටු අංක 23 හි තම අදහස් දැක්වීම යටතේ සඳහන් අදහස, බස්නාහිර පළාතේ දිනකට ප්ලාස්ටික් ජල බෝතල් ලක්ෂ 05 කට වැඩි ප්‍රමාණයක් මුහුදට මුදා හැරීම සිදු කරන ලදී. ප්ලාස්ටික් ජල බෝතල් භාවිතය අවම කිරීම සියලුම දෙනා සිදු කරන්නේ නම්, ඒ සඳහා යන වියදම සහ පරිසර දූෂණය අවම කර ගත හැකිය. එම නිසා මා ප්‍රතිපත්තියක් ලෙස සභාවෙන් ලබා දෙන ජල බෝතලය භාවිතා නොකිරීමට කටයුතු කරන ලදී යනුවෙන් සංශෝධනය විය යුතුය.

2022.04.08 මහා සභා වාර්තාවේ පිටු අංක 23 හි තම අදහස් දැක්වීම යටතේ සඳහන් අදහස, උද්ධකන්දර ප්‍රදේශයේ පවතින අක්කර 500 ක භූමි ප්‍රමාණය ලබා දීමේ දී කොටසක් ව්‍යවසායකයින්ට ලබා දීමට යෝජිත වී ඇති බැවින්, එකී භූමි ප්‍රමාණය ලබා දීමේ දී ව්‍යසායකයකු නිර්මාණය කිරීම ප්‍රදේශය තුළින්ම තෝරා ගැනීම කළ යුතුය යනුවෙන් සංශෝධනය විය යුතුය.

**(ආ)** ගරු සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදනය **-**

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන**

**(ඈ)** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න **-**

**(ඉ)** යථා පරිදි කල් දී ඇති යෝජනා **-**

- **ගරු සභාපති විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා**

01. තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික ස්ථානවලින් වාර්ෂිකව අය කරනු ලබන ව්‍යාපාර බදු, බලපත්‍ර ගාස්තු (පසුගිය වර්ෂයන්ගේ හිඟ මුදල) එන්තරාවාසී නිකුත් කර, අය කර ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

02. පන්නෙගමුව තොග පොළ භූමියේ කැටගල් ඇල්ලීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් 2021.04.20 දිනැති 2693 අංක දරණ බිල්පත සඳහා ජී.ඩබ්. හාඩ්වෙයාර් ආයතනය වෙත රු. 75,000.00 ක මුදල ගෙවීම් කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

03. පන්නෙගමුව තොග පොළ භූමියේ කැටගල් ඇල්ලීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් 2021.04.20 දිනැති 2694 අංක දරණ බිලපත සඳහා ජී.ඩබ්. හාඩ්වෙයාර් ආයතනය වෙත රු. 87,562.50 ක මුදල ගෙවීම් කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

04. 2021.03.27 දින දිදුල අයන් වර්ක්ස් ආයතනය වෙත නිකුත් කරන ලද රු.13,258.00 ක් වටිනා අංක 465128 දරණ චෙක්පත මාස 06 ක් ඉක්ම වූ පසුත් මාරු කර නොගැනීම හේතුවෙන්, 2021.11.11 දින සභා ආදායමට ගන්නා ලදී. නැවත එම මුදල ලබාදෙන ලෙස එම ආයතනය මඟින් කළ ඉල්ලීම අනුව නැවත ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු මහ සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.

✓ මෙකී චෙක්පත කුමක් සඳහා නිකුත් කරන එකක්ද යන්න තොරතුරු දැන ගැනීම සඳහා ගරු සභික, ඒ.පී. ධම්මික මහතාගේ සහ ගරු සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතාගේ යෝජනා ස්ථීරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

එහිදී අදහස් දැක්වූ ලේකම්තුමිය විසින් ප්‍රකාශ කරන ලද්දේ, මිල ගණන් ලබා ගත් මෙම ආයතනය මගින් ආයතනය සඳහා ජල උපකරණ අලුත්වැඩියාව වෙනුවෙන් උපකරණය ලබා ගැනීමට අදාළව ලියන ලද මෙම චෙක්පත, මාස 06 ක් වන තුරුත් මාරු කර ගෙන නොමැති නිසා, මෙය විගණන විමසුම්වලටද ලක්විය හැකි බැවින්, මේ බව දන්වා ලිපි යොමු කළද, ඒ සඳහා ද කිසිදු පිළිතුරක් ලබා නොදුන් බැවින්, මෙම මුදල් සභා ආදායමට ගැනීමට තීරණය කර තිබියදී, පසුව එම ආයතනය මගින් මෙම මුදල් ලබා දෙන ලෙස නැවත ඉල්ලීමක් කර ඇති බව ප්‍රකාශ කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>මෙකී කාර්යය නෛතික ක්‍රියාවලිය ඇතුළත සිදු කිරීමට උපදෙස් ලබා දෙන ලදී.</u>

✓ ගරු සභික, ඒ.පී. ධම්මික මහතාගේ සහ ගරු සභික, ආර්.කේ.එම්. රෝහිත මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාවක් බවට පත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් කඩකාමර වල 2022.03.31 දිනට රු.30,000.0 ට වැඩි හිඟ කඩ කුලී නොගෙවූ කඩහිමියන් වෙත එන්තරවාසි නිකුත් කිරීම සුදුසු බවත්, ඒ සඳහා සුදුසු නීතීඥවරයකු මඟින් කටයුතු කිරීම සුදුසු බවට ගරු මහ සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>මෙකී කටයුතු සිදු කිරීමේ දී නීත්‍යානුකූලව සිදු කිරීමටත්, ඔවුන් විසින් මෙකී මුදල් වාරික වශයෙන් ගෙවීමට එකඟ වුවහොත්, ඒ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කිරීමටත් තීරණය විය.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් ස්ථානයෙහි පිහිටි කඩ කාමරයේ බදු අයිතිය පහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බවට ගරු මහ සභාවට යෝජනා කරමි.

| ස්ථානය | දැනට බදු අයිතිය | පැවරුම්ලාභියා | මුදල අය කරන ආකාරය |
|---|---|---|---|
| තිස්සමහාරාම පොදු වෙළඳපොළ කඩකාමර - අංක 110 | ජේ.කේ.රංජිත් | ඒ.ටී.එන්.ඊ.ජයසූරිය | එක්වන් මුදල ගෙවා |
| තිස්සමහාරාම පොදු වෙළඳපොළ කඩකාමර - අංක 75 | ඩී.වී.කරුණාදාස | ඩී.වී.කාවින්දි සත්සරණී | පියාගෙන් දුවට |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07. කාවන්තිස්සපුර තුරු සෙවණ අසල කඩකාමර සඳහා ප්‍රධාන තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුව ලැබෙන තෙක්, තාවකාලික තක්සේරුවක් පදනම් කර ගෙන, එම ප්‍රදේශයේ ම සුදුසු පුද්ගලයින් 15 දෙනෙකු සඳහා ගිවිසුම් ප්‍රකාරව මාසික කුලී පදනම මත කඩකාමර ලබා දීම සඳහා 2022.01.24 දින පැවති ගරු මහ සභාවේ අනුමැතිය හිමි වූ අතර, කඩපෙළ අවශ්‍ය පරිදි සකසා ගැනීම, විදුලිය සපයා ගැනීම ආදිය ඔවුන් විසින් ම සිදු කර ගැනීමට එකඟ විය. එබැවින්, රට තුළ පවතින තත්ත්වය හේතුවෙන්, රු.500.00 ක් ව පවතින කඩ කුලිය රු.250.00 ක් ලෙස අඩු කරන ලෙස කඩහිමියන් විසින් ඉල්ලීම් කර ඇති අතර, එම ඉල්ලීම ඉටුකිරීම සුදුසු බව ගරු මහ සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

08. ප්‍රාදේශීය සභාව සතු රථවාහන සඳහා අමතර කොටස් ලබා ගැනීම හා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම් අනුමැතිය ලබා දීමට මෙම ගරු සභාව යෝජනා කරමි.

උප ලේඛනය

ගෙවීම් විස්තරය

| අනු අංකය | විස්තරය | ගෙවනලදද/ගෙවීමට ඇති ආයතනය | බිල්අංකය සහ දිනය | මුදල (රු.) |
|---|---|---|---|---|
| I | 56-1099 කැබ් රථය සඳහා 215x75x15 ටයර් 02 ක් මිලදී ගැනීම | ශාන්ති ටයර් මාර්ට් ප්‍රයිවට් ලිමිටඩ්, දික්වැල්ල | 9657 2022.05.05 | 71,200.00 |
| II | PF-7365 කැබ් රථය සඳහා 265x70x16 Maxxis ටයර් 04 ක් මිලදී ගැනීම | ශාන්ති ටයර් මාර්ට් ප්‍රයිවට් ලිමිටඩ්, දික්වැල්ල | 9655 2022.05.05 | 294,800.00 |
| III | LO-2933 ජල බවුසරය අලුත්වැඩියා කිරීම | කොතලාවල ඉංජිනියර්ස්, දෙටගමුව, කතරගම | 315 2022.05.12 | 132,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| IV | JS-9860 CAT බැකෝ ලෝඩරය අලුත්වැඩියා කිරීම | ආරියපාල ඔටෝ ඉංජිනියර්ස් | 7903<br>2022.04.28 | 23,150.00 |
| V | 227-5807 ජල බවුසරය සඳහා ස්ටාර්ට් මෝටරයක් දැමීම | ක්‍රිෂාන්ත ඉලෙක්ට්‍රිකල්ස් | 47788<br>2022.05.04 | 32,000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

09. LM-5616 කම්පැක්ටර් රථයේ පසුපස රෝද සඳහා 825x16 ප්‍රමාණයේ ටයර් 04 ක්, ටියුබ් 04 ක් හා රිම්ටේප් 04 ක් මිලදී ගැනීමට මෙම ගරු සභාව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

10. 2020 ජනවාරි 01 දින සිට තිස්සමහාරාම මහසෙන්පුර ආදාහනාගාරයේ එක් ආදාහනයක් සඳහා අය කරනු ලබන ගාස්තුව, බල ප්‍රදේශයේ ආදාහනයක් වෙනුවෙන්, රු.7,500 .00 ක් ද, බල ප්‍රදේශයෙන් පිටත ආදාහනයක් වෙනුවෙන් රු. 8,500 .00 ක් ද වන ලෙසට අය කළ අතර, 2020 ගැසට් පත්‍රයට අනුව මෙලෙස ආදාහනාගාර ගාස්තු ඉහල දැමීම සිදු කරන විට, කි.ග්‍රෑ. 37.5 ක ගෑස් සිලින්ඩරයක මිල රු. 6,135.00 ක් ලෙස පැවතුන බවත්, එම කාලය තුළ කිසිදු විදුලි අර්බුධකාරී තත්ත්වයක් ද මතු නොවීය. නමුත්, දැනට කි.ග්‍රෑ. 37.5 ක ගෑස් සිලින්ඩරයක මිල රු. 17,250.00 ක් ලෙස ඉහල යාමත්, විදුලි අර්බුධය නිසා ආදාහන සිදු කිරීමට ජෙනරේටරයක් යොදා ගැනීම වෙනුවෙන් දෛනිකවරු. 6,000.00 ක මුදලක් ගෙවීමට සිදු වන බැවින්, ආදාහන ගාස්තු වැඩි කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.
එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.

- ❖ අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා

හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පවතින පළාත් පාලන ආයතනවල ගෑස් මිල ඉහල යාමෙන් පසුව, ආදාහන සඳහා අය කරනු ලබන ගාස්තු පිළිබඳ වාර්තාවක් ලබා ගෙන ඇත. එම බොහෝ ආයතනයන්වලත්, අප සභාවට ආසන්නව පවතින අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේද, බල ප්‍රදේශය තුළ ආදාහනයක් සඳහා රු. 10,000.00 ක් ද බල ප්‍රදේශයෙන් පිටත ආදාහනයක් සඳහා රු. 12,000.00 ක ගාස්තුවක්ද අය කරන බැවින්, තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ද 2022.05.18 දින සිට බල ප්‍රදේශය තුළ ආදාහනයක් සඳහා රු. 10,000.00 ක් ද, බල ප්‍රදේශයෙන් පිටත ආදාහනයක් සඳහා රු. 12,000.00 ක ගාස්තුවක්ද අය කිරීම සුදුසු බව සියලුම දෙනා ඒකමතිකව තීරණය කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

11. සභාව සතු රථවාහන 2022 වර්ෂය සඳහා රක්ෂණාවරණය ලබා ගැනීමට මිළ ගණන් කැඳවා ලැබී ඇති මිළ ගණන් ලැබෙන ප්‍රතිලාභ පදනම් කර ගනිමින් අදාළ රක්ෂාවරණය ලබා ගැනීමට රක්ෂණ ආයතනය තෝරා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

| හදිසි අනතුරු ගින්න , බාහිර පිපිරීම් ,විදුලි කෙටීම ,ස්වයං දහනය. | ජාතික රක්ෂණ භාර අරමුදල | | ෆෙයාර්ෆස්ට් රක්ෂණ ආයතනය | | | අලියන්ස් රක්ෂණ ආයතනය | | | සමුපකාර රක්ෂණ ආයතනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| සොරබිය ද්වේශ සහගත හානි | | | | | | | | | | |
| ගංවතුර සහ ස්වභාවික විපත් ආවරණය | √ | | √ | | | √ | | | | |
| වැඩ වර්ජනය හා කැරකි කෝලාහල ආවරණය | √ | | √ | | | √ | | | | |
| තුන්වන පාර්ශව මරණ හා තුවාල වෙනුවෙන් | අසීමිත ආවරණය | | අසීමිත | | | මිලියන දෙක දක්වා | | | | |
| තුන්වන පාර්ශව දේපළ වෙනුවෙන් (මෝටර් රථ සඳහා) | අසීමිත ආවරණය | | ලක්ෂ 5 | | | | | | | |
| තුන්වන පාර්ශව දේපළ වෙනුවෙන් | ලක්ෂ 5 | | | | | | | | | |
| පුද්ගල හදිසි අනතුරු ආවරණය | (පුද්ගලයන් 04 සඳහා) | | | | | | | | | |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **WPPF-7365 /56-1099** | | | | | | | | | | | | | | | | |
| පුද්ගල හදිසි අනතුරු ආවරණය(පුද්ගලයන් 02 සඳහා) | | | | | | (පුද්ගලයන් 02 සඳහා) | | | | | | | | | වෙන් වශයෙන් පැහැදිලි කර නොමැත | |
| **SPLM 5616** | | | | | | | | | | | | | | | | |
| කම්කරු වන්දි රක්ෂණය | | | | | | | | | | | | | | | | |
| ඇද ගෙන යාමේ ගාස්තු | | | | | | | | | 10000 | | | | | | | |
| කුලියට මිළදී ගැනීමේ ආවරණ | | | | | | | | | √ | | | | | | | |
| තුන්වන පන්තිය රක්ෂණ | | | | | | √ | | | 15000 - දේපල | | | | | | | |
| | අමතර ප්‍රතිලාභ | | | | | | | | කම්කරුවන් 109 ක් සඳහා ආවරණය | | | 15 දෙනෙකු සඳහා ආවරණය රු. 800,000.00 බැගින් | | | | |
| එකතුව | | | | | | 89,098.26 | | | 212,119.00 | | | 2,457.40 | | | 231,279.95 | |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ජ්. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ජාතික රක්ෂණ භාර අරමුලෙහි මුදල අවම වුවත්, අප ආයතනයට ලැබෙන ප්‍රතිලාභ පදනම් කර ගෙන රථ වාහන රක්ෂණ කිරීමේ දී අමතර ප්‍රතිලාභයක් ලෙස, කම්කරුවන් 109 ක් සඳහා රක්ෂණාවරණයක් නොමිලයේ ලැබෙන නිසාත්, 2022 වර්ෂයට අප ආයතනයේ රථවාහන රක්ෂණය කිරීම සඳහා ෆෙයාෆස්ට් රක්ෂණ ආයතනයෙන් රක්ෂණාවරණය ලබා ගැනීම සුදුසු බවට තීරණය විය.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

12. රට තුළ පවතින අයහපත් ආර්ථික තත්ත්වය හා අනෙකුත් අර්බුධකාරී තත්ත්වය හේතුවෙන් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු සියළු කඩ කාමර වලින් අය කරනු ලබන මාසික කඩ කුලී මුදල් ගෙවීම පැහැර හැරීමේ දී අය කරනු ලබන 10% ක දඩ මුදල 2022 වර්ෂයේ මැයි මාසය අය නොකර එම කඩ බදුහිමියන් වෙත සහන ලබා දීම සුදුසු බවට අනුමැතිය ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

    එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.ක්. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී
    එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

13. පළාත් පාලන ආයතන සතු වාහන පළාත් පාලන ආයතන ප්‍රධානීන් (නගරාධිපති/සභාපති) නිල වාහන ලෙස භාවිතා කිරීම පිළිබඳ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 4/04/10 හා 2020.09.22 දිනැති ලිපිය අනුව හා දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ දපස/ප්‍රඅමා/ආ7/1/1 හා 2014.10.21 දිනැති ලිපියේ උපදෙස් පරිදි සභාපතිවරයාට බලතල පවරාදීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

    1. පළාත් පාලන ආයතනයේ සභාපතිතුමන්ගේ නිල කාර්යයන් සඳහා වෙන් කළ වාහනයක් , ස්වකීය පෞද්ගලික කාර්යයන් සඳහා යොදවා ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා සභාපතිවරුන් සෑම ලිත් මාසයක් සඳහාම ඒ සම්බන්ධයෙන් රු. 300.00 ක මුදලක් පළාත් පාලන ආයතන අරමුදලට ගෙවීම් කළ යුතුය.

    2. සභාපතිවරයා සඳහා වෙන් කරන ලද නිල වාහනයට රියදුරකු යොදවා ගැනීමට අපහසු හදිසි අවස්ථාවකදී සභාපතිවරයා විසින්ම එකී නිල රථය ධාවනය කිරීම සිදු කළ හැකිය. ඒ සඳහා සභාපතිවරයාට වලංගු රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය.

3. නිල වාහනය රාජකාරී සඳහා යොදවා නොගන්නා අවස්ථාවලදී සහා පරිශ්‍රයේ හෝ සභාපතිවරයා භාරයේ වෙනත් සුදුසු ස්ථානයක ගාල් කර තැබීම සිදු කළ හැකිය.

ඉහත අංක 1 , 2 හා 3 පරිදි සභාපතිවරයා කටයුතු කිරීමේදී අනතුරක් සිදුවුවහොත් එහි වගකීම සභාපතිවරයා සතුවේ.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

14. රට තුළ පවතින අයහපත් ආර්ථික තත්ත්වය යථා තත්ත්වයට පත්වන තෙක්, 2022 වර්ෂය සඳහා බදු අයිතිය ලබා දී ඇති දේපළ වෙනුවෙන් බදු වාරිකය සමඟ අය කරනු ලබන ප්‍රමාද ගාස්තුව 2022 අප්‍රේල් මස සිට අය නොකර එම බදුහිමියන් වෙත සහනයක් ලබා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.ක්. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

15. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු දේපළ 2022 වර්ෂයට බදු අයිතිය ලබා දීම සඳහා ප්‍රසම්පාදන දැන්වීම් ලේක් හවුස් ආයතනයේ පුවත්පත්වල තෙභාෂාවෙන් පල කිරීම වෙනුවෙන් අංක MT 379/21, 380/21, 381/21 හා 2021.11.03 දිනැතිව එවා ඇති බිල්පත් අනුව ගෙවිය යුතු රු. 105,914.25 ක මුදල ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභාවල වාර්තා සළකා බැලීම -**

- 2022.05.05 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සළකා බැලීම.

  සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

- 2022.05.05 වන දින පැවති නිවාස හා ප්‍රජා කාරක සභා වාර්තාව සළකා බැලීම.

  සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

- 2022.05.05 වන දින පැවති කාර්මික සේවා කාරක සභා වාර්තාව සළකා බැලීම.

  සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

- 2022.05.05 වන දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව සළකා බැලීම.

  සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

## (ඉ) වෙනත් කරුණු

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.ඩබ්. නන්දා මහත්මියගේ අදහස් දැක්වීම</u>**

පසුගිය දිනක ඇති වූ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් ගරු සභාපතිතුමාගේ සහ ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ සහ චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවියගේ නිවෙස් සඳහා සිදු වූ හානියට මාගේ දැඩි කණගාටුව පල කරන ලදී.

එසේම පවතින රජයේ ගරු අග්‍රාමාත්‍ය ධූරය අප නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා භාර ගැනීම වෙනුවෙන් තම ප්‍රසංශනීය ගෞරවය පුද කරන ලදී.

පසුගිය 2022.05.09 දින ගෝල් ෆේස් එකෙහි සිදු වූ අරගලය කිසි දිනක අනුමත කළ නොහැක. ගෝල් ෆේස් අරගලය නිසා මිනිසුන් දිනා ගත් දේ බෝහෝය. එකී දිනා ගත් සෑම දෙයක්ම අප රටේ සියලුම ජනතාවට හිමි වනු ඇත. එසේ සාමකාමී අරගලයට ගොස් ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සිදු කිරීම නිසාම මිනිසුන් දැඩි දේශයෙන් යුතුව කටයුතු කිරීමට පෙළඹී ඇත. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා රට තුළ ගෞරවයකින් සිටියද, එම ගෞරව නාමයට අගෞරවයක් සිදු කරන ලද්දේ ද මිනිසුන් විසින්මය.

ගෝල් ෆේස් භූමියේ ඇති වූ අරගලය හේතු කොට ගෙන අප ප්‍රදේශයේද ජනතාව දැඩි ආවේගයකින් යුතුව මහජන නියෝජිතයින්ගේ නිවෙස් සඳහා දැඩි හානි සිදු කරන ලදී. හිසට නිවසක් වූ නිවසද ගිනිබත් කර, කඩා දැමීමට කටයුතු කිරීම ඉතාමත් වැරදි ක්‍රියාවන්ය. මිනිසුන් විසින් මෙසේ හැසිරෙන්නේ ඔවුන් තුළ ඇති සාරධර්ම ඔවුන් තුළින් ගිලිහී යාම නිසා බව කිව හැකිය. සිදු වූ මෙවැනි ක්‍රියාවන් ඉතාමත් පිළිකුල් සහගතව හෙලා දකින බවත්, උතුම් වෙසක් මාසය තුළ සිදු වූ මෙවැනි ක්‍රියා අධර්මවාදී ක්‍රියාවන් බවත් සඳහන් කරන ලදී.

රට අර්බුධකාරී තත්ත්වයක පවතින කාලයක් තුළ ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් අග්‍රාමාත්‍ය ධූරය භාර ගැනීමට කටයුතු කිරීම හොඳ ක්‍රියාවක් වන බවත්, ගරු එතුමන්ට මෙම ධූරයේ වැඩ භාර ගෙන රටේ ඇති වී තිබෙන අර්බුධකාරී තත්ත්වයන් අවම කර, රට ගොඩ නැගීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මියගේ අදහස් දැක්වීම</u>**

පසුගිය දිනක ඇති වූ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් ගරු සභාපතිතුමාගේ සහ ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ සහ චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවියගේ නිවෙස් සඳහා සිදු වූ හානියට මාගේ දැඩි කණගාටුව පල කරන ලදී. මෙලස සිදු කළ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් කුමන පුද්ගලයෙක් සිදු කළත් එවැනි ක්‍රියාවන් සඳහා තමා අකමැති බවත්, කිසි දිනක අනුමත කළ නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී. රට තුළ සිදු වන ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් තමා දැඩි සේ හෙලා දකින ලදී.

ප්‍රාදේශීය සභාව විසින් සිදු කරනු ලබන නිවැරදි ක්‍රියාවන් සඳහා එදා සේම ඉදිරියටත් තමා සහාය ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී. එසේම 2022.05.09 වන දින සිදු වූ අරගල ක්‍රියවන්වලදී සිදු වූ හානිවීම් වැළැක්වීම සඳහා තමා වෙත මැදිහත්වීමට නොහැකි වීම සම්බන්ධයෙන් කණගාටු වන බව ප්‍රකාශ කරන ලදී.

ඉදිරියේ දී රට නව ස්ථාවරයකට පත් කර ගැනීමටත් රට ගොඩ නැගීමටත් නව ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ජී.එච්.ජී. නීටා මහත්මියගේ අදහස් දැක්වීම</u>**

ගරු සභාපතිතුමා යනු තිස්සමහාරාම පුරවරයට නායකත්වයක් ලබා දුන්, තිස්සමහාරාමයට අභිමානයක් එක් කළ, මානව හිතවාදී හොඳ මනුස්සයෙක් ලෙස දැක්විය හැකිය. එසේ වී තිබියදීත් මෙම වෙසක් මාසය තුළ සිදු කළ ප්‍රචණ්ඩ ක්‍රියාව නිසා ගරු සභාපතිතුමාගේ සහ ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ සහ චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවියගේ නිවෙස් සඳහා සිදු වූ හානියට මාගේ දැඩි කණගාටුව පල කරන බවත්, මෙවැනි සිදුවීම් දැඩි සේ හෙලා දකින බවත් ප්‍රකාශ කරන ලදී.

අප ප්‍රදේශය තුළ මෙවැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියා සිදු කිරීමට හැකි තිරිසනුන් සිටින සමාජයක් තුළ දේශපාලනයෙන් සමුගන්නා ලෙස තම නිවෙස්වලින්ද ප්‍රකාශ කරන ලදී. ඒ තරමටම දේශපාලනය පිරිහී ගොස් ඇති බව සඳහන් කළ යුතුය.

නිවෙස් ගිණි තබා, කුඩු කර දේපළ හානි කිරීම ගරු සභාපතිතුමා ඇතුළු අනෙක් ගරු සභිකයින් දෙදෙනාට පමණක් සිදු කළ ක්‍රියවක් නොවන බවත්, මෙය අප සියලුම දෙනාට සිදු කළ පහරදීමක් බවත් කිව හැකිය. වෙසක් මාසය තුළ සිදු කරන්නා වූ මෙකී විනාශයට සම්බන්ධ සියලුම දෙනාට ස්වභාවය දහමෙන් ලැබිය යුතු විපාකයන් ලැබෙනු ඇත. එම නිසා ගරු සභාපතිතුමාටත්, ගරු සභික ටෂිත සමිල මහතා, චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවියටත් මෙම සිදු වූ සිදුවීම් වලින් කඩා නොවැටී ශක්තිමත් වී ඉදිරි කටයුතු සිදු කරන ලෙසට දන්වා සිටින ලදී.

මෙකී ප්‍රචණ්ඩකාරී ක්‍රියාව ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ නියෝජිතයින් විසින් සිදු කළ බවට තොරතුරු දැන ගැනීමට ලැබී ඇත. එම පක්ෂයේ නියෝජිතයින් එසේ සිදු කළත්, ගරු සභාපතිතුමාගේ හොඳ මනුස්සකම නිසා අප සභාව තුළ කිසි දිනක අප පක්ෂයේ නියෝජිතයින්ට හෝ ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ ගරු සභිකයින්ට කිසිදු වෙනසක් නොමැතිව සියලුම දෙනාට සමසේ සිතා කටයුතු කළ බව සිහිපත් කළ යුතුය.

2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියාව හේතුවෙන් ගරු සභාපතිතුමාගේ නිවස සහ දේපළවලටත්, වාහන කිහිපයකටත් හානි සිදු කර ඇත. මෙම දේපළයන්, වාහන සියල්ල ගරු සභාපතිතුමා විසින් ලබා ගන්නා ලද්දේ එතුමන් දහඩිය මහන්සියෙන් සිදු කරන්නා වූ ව්‍යාපාර කටයුතුවලින් හරි හම්බ කර ගත් මුදලින්ය. මේ කිසිවක් දේශපාලනය නිසා හරි හම්බ කර ගන්නා දේවල් නොවන බව මා හොඳින් දන්නා කරුණකි. මෙවැනි විනාශකාරී ක්‍රියාවන් සිදු කළ සහ ඒ සඳහා පෙළඹවීම් සිදු කළ සියලුම දෙනාට එල විපාක මෙලොවදීම ලැබිය යුතුය.

එසේම එදින සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියාව හේතුවෙන් මාගම කොට්ඨාසය නියෝජනය කරන ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ අලුතින් සකස් කළ නිවස ගිණි තබා විනාශ කර තිබීමේ සිද්ධිය සම්බන්ධයෙන් දැඩි සේ තමා කණගාටු වන ලදී. එතුමන් මාගම කොට්ඨාසයට සේම, තිස්සමහාරාම පුරවරයේම ජනතාවට සේවයක් කිරීමට ඇප කැප වූ නියෝජිතයෙකි. හිසට සෙවනක් වූ නිවසක් ගිණි තබා සිදු කළ විනාශයට සම්බන්ධ සියලුම දෙනාට නීතිය ක්‍රියාත්මක විය යුතු සේම ඒ සඳහා ලැබිය යුතු විපාක ලැබිය යුතුය.

ගරු සභික, චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවියගේ ද නිවස එදින කුඩු කර දමා හානි කර තිබීම සම්බන්ධයෙන්ද තමා කණගාටු වූ බව ප්‍රකාශ කරන ලදී. එතුමිය සේම එතුමියගේ පියාද ජනතාව වෙනුවෙන් සෑම අවස්ථාවකම ඇප කැප වූ කටයුතු කළ අයවලුන්ය. මෙකී සෑම සිදුවීමක්ම හෙලා දකින අතර, මෙකී සිදුවීම්වලට සම්බන්ධ සියලුම දෙනාට එල විපාක ස්වභාව දහමෙන් යම් දිනක ලැබෙනු ඇත.

ප්‍රචණ්ඩකාරී ක්‍රියා යනු දේශපාලනයේ පහත්ම ක්‍රියාවන්ය. 2022.05.09 වන දින සිදු වූ සෑම ක්‍රියාවක්ම තමා දැඩි සේ හෙලා දකින බව ප්‍රකාශ කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, චමින්ද ඩයස් වන්නිගේ මහතාගේ අදහස් දැක්වීම</u>**

2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් ගරු සභාපතිතුමාගේ සහ ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ සහ චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවියගේ නිවෙස් සඳහා සිදු වූ හානියට මාගේ දැඩි කණගාටුව පල කරන ලදී.

රටේ පවතින පාර්ලිමේන්තුවේ නියෝජිතයින් කුමන ප්‍රචණ්ඩ ක්‍රියාවන් ඇති කර ගනිමින් කටයුතු කළද, අප සභාවක් ලෙස මහජන නියෝජිතයින් 23 දෙනාම එකට හිඳ සාමූහිකව කටයුතු කළ යුතුය. අද වන විට එසේ නොමැති වීම මත අප අප ප්‍රදේශයේත් එවැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සිදු වීමට ඉඩකඩ සැලසී ඇති බව සඳහන් කළ යුතුය.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතාගේ අදහස් දැක්වීම</u>**

2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් ගරු සභාපතිතුමාගේ සහ ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ සහ චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවියගේ නිවෙස් සඳහා සිදු වූ දැඩි හානිවීම් සම්බන්ධයෙන් මාගේ දැඩි කණගාටුව පල කරන ලදී.

අප මහජන නියෝජිතයින් ලෙස තිස්සමහාරාම බල ප්‍රදේශයේම ජනතාව වෙනුවෙන් සේවය කිරීමට ඇප කැප වී ඇත. දේශපාලන පලි ගැනීම් සම්බන්ධයෙන් සිදු කරන්නාවූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් කිසි දිනක අනුමත නොකරන බවත්, එවැනි ක්‍රියා තුළින් අප දේශපාලනයට සමු නොදෙන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතාගේ අදහස් දැක්වීම</u>**

දේශපාලනය ගත් කළ වර්ෂ 1974 සිටම පැමිණෙන භීෂණ තත්ත්වයක් මෙම කාලයේ ද ඇති වී ඇති බව සඳහන් කළ හැකිය. රටේ ජනතාවට නිදහසේ හුස්ම ගැනීමට වටපිටාවක් සකස් කර දුන් අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අග්‍රාමාත්‍යතුමාට ඉවත් වන ලෙසට රටේ ජනතාව ප්‍රකාශ කරයි. රට තුළ කොවිඩ්-19 වෛරස් තත්ත්වය ව්‍යාප්ත වීමත් සමඟ රටේ ජනතාව මිය යාමට ලක් වූ අවස්ථාවකදී ඒ සඳහා අවශ්‍ය කරන එන්නත් ලබා දෙමින් ජනතාවගේ ජීවිත බේරා ගැනීමට අප අතිගරු ජනාධිපතිතුමා කටයුතු සිදු කරන ලදී. එසේ මැදිහත් වී කොවිඩ් එන්නත් රටේ ජනතාවට ලබා දුන් නිසා රට තුළ මරණ සංඛ්‍යාව අඩු කර ගැනීමට හැකි විය.

එසේම අප අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා අතිගරු ජනාධිපතිතු ධූරය දරන කාලයේ රටේ පැවැති කුරිරු යුද්ධය නිමා කර, රටේ ජනතාවට නිදහසේ ජීවත් වීමට අවශ්‍ය කරන වටපිටාව සකස් කර දුන්නද, ඒ කිසිවක් මතකයේ නොමැති ලෙස අද එතුමන්ට රටේ ජනතාව විසින් අගෞරව කිරීම වැරදි ක්‍රියාවක් ලෙස සඳහන් කළ යුතුය.

ප්‍රචණ්ඩකාරී විනාශකාරී ක්‍රියා සිදු නොකර, සියලුම දෙනා එක්ව රටට යහපතක් උදා කර ගැනීමට කටයුතු කළ යුතුය. පසුගිය දිනක සිදු කරන ලද ප්‍රචණ්ඩකාරී ක්‍රියාව තමා දැඩි සේ හෙලා දකින ලදී. කුමන පක්ෂයක් විසින් මෙවැනි දේශපාලන ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සිදු කළත්,අපගේ දේශපාලන ගමන් මග කිසි දිනක නතර නොවනු ඇත. මෙලෙස සිදුවන සෑම සිදුවීමකින්ම අප තව තවත් ශක්තිමත් වී ජනතාව වෙනුවෙන් ඉදිරියටත් කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී.

2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් ගරු සභාපතිතුමාගේ සහ ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ සහ චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවියගේ නිවෙස් සඳහා සිදු වූ හානියට මාගේ දැඩි කණගාටුව පල කරන ලදී. එසේම එම සිදුවීම පිළිකුල් සහගත ලෙස හෙලා දකින

බවත් සඳහන් කරන ලදී. අප සභාවේ සියලුම මහජන නියෝජිතයින් කිසි දිනක කිසිදු වංචාවක්, සොරකමක් සිදු කර නොමැති, ඉතාමත් අසරණ සේ ජීවත් වූ අයවලුන් වන බවත්, ඔවුන්ගේ නිවෙස්ද ඉතාමත් දුක සේ ඔවුන් සිදු කරන රැකියා, ව්‍යාපාර කටයුතු වලින් ලැබෙන ආදායමින් සකස් කර ගත් ඒවා බවත් අප සියලුම දෙනා දන්නා කරුණකි.

එසේම එදින අප නිවෙස් සඳහා ද හානි සිදු කිරීමට මෙම ප්‍රචණ්ඩකාරී මිනිසුන් සැලසුම් කිරීමේදී, තමාගේ ගමේ ජනතාව සිදු වීමට තිබූ හානිය වළක්වා ගැනීම සඳහා තමා සමඟම සිටි බවත්, මා වෙනුවෙන් එලෙස ඇප කැප වූ මාගේ කොට්ඨාසයේ ජනතාවට මාගේ ස්තූතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදී.

අප රටට මේ වන විට ඇති වී ඇති තත්ත්වයෙන් රට ගොඩ නැගීමට තමාට කළ හැකි සහාය ඉදිරියටත් ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී.

එසේම රට අර්බුධකාරී තත්ත්වයකට පත්ව ඇති අවස්ථාවක අග්‍රාමාත්‍යධූරය භාර ගැනීමට කටයුතු කළ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ස්තූතිය පුද කරනවා සේම, එතුමන්ට රට යහපත් රටක් බවට පත් කර ගැනීමට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

තම කොට්ඨාසයේ අත්‍යාවශ්‍ය අවස්ථාවන්වලදී විථි ලාම්පු සවි කර ගැනීම සඳහා, සභාවේ ඊට අදාළ සේවක මහතුන් වෙත දැනුම් දුන්නද, අවස්ථා කිහිපයකදීම එකී කාර්යය සිදු කර ගැනීමට නොහැකි වූ බැවින්, මේ සම්බන්ධයෙන් සොයා බලන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතාගේ අදහස් දැක්වීම</u>**

2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් ගරු සභාපතිතුමාගේ සහ ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ සහ චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවියගේ නිවෙස් සඳහා සිදු වූ හානියට මාගේ කණගාටුව පල කරන ලදී.

අප සභාව තුළ සිටින සියලුම පක්ෂ නියෝජිතයින් එක මවකගේ දරුවන් සේ එකට සාමූහිකව කටයුතු කළ බවත්, කිසිදු පක්ෂයක ගරු සභිකවරයෙකුට කිසිදු වෙනසක් නොමැතිව එක සේ සලසා කටයුතු කර තිබියදීත්, සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියවන් සඳහා අප සභාවේම පක්ෂයන් සම්බන්ධ වී කටයුතු කිරීම පිළිබඳ අදටත් කරුණු සිතා ගත නොහැකි බව ප්‍රකාශ කරන ලදී. කෙසේ හෝ මෙම සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්වලින් අප දේශපාලනය නතර කළ නොහැක. මෙම සිදුවීම් වලින් පන්නරය ලබා ගෙන, ඉදිරියටත් ජනතා සේවය වෙනුවෙන් මෙම දේශපාලනය සිදු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

තම කොට්ඨාසයේ ජලය බෙදා දෙනු ලබන ගම්මාන සඳහා පිවිසෙන මාර්ගවල ගමන් කිරීමට නොහැකි බැවින්, එකී මාර්ග හැකි නම් මෝටර් ග්‍රේඩර් කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතාගේ අදහස් දැක්වීම</u>**

ගරු සභාපතිතුමාගේ සහ ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ සහ චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවියගේ නිවෙස් සඳහා 2022.05.09 වන දින ඇති වූ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් සිදු වූ හානියට මාගේ කණගාටුව පල කරන ලදී. මිනිසුන් හිසට සෙවනක් ලබා දුන් නිවෙස් ගිණි බත් කර, කුඩු කර දැමීමට කටයුතු කළද, අප කුරුලු කූඩුවක් හෝ කඩා දැමීමට නොහැකි තරම් සන්වේදී වුවත්, මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්ට සම්බන්ධ කිසිවෙක් සන්වේදීකමක් නොමැති, ඉතාමත් පාපකාරී මිනිසුන් බව කිව හැකිය. අතීතයේ ජනතා විමුක්ති පෙරමුණ කාලයේ පැවැති භීෂණ තත්ත්වයක්ම අදටත් එම පක්ෂයෙන් පත් කර ඇති බව සඳහන් කළ යුතුය. එසේම ඉහත දින සිදු

කරන ලද ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සියල්ල ජනතා විමුක් පෙරමුණ විසින් සිදු කර ඇති බවත් සඳහන් කරන ලදී.

එසේම අප ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා අතිගරු ජනාධිපතිතු ධූරය දරණ කාලයේ රටේ පැවැති කුරිරු යුද්ධය නිමා කර, රටේ ජනතාවට නිදහසේ, ආරක්ෂිතව ජීවත් වීමට අවශ්‍ය කරන වටපිටාව සකස් කර දුන් රට දැය බේරා ගත් උතුම් නායකයෙකි. එතුමා රට වෙනුවෙන් සිදු කළ සේවය කිසි දිනක අපට අමතක නොවෙනු ඇත. එම නිසාමත්, එතුමා පිළිබද අප හදවතේ තිබෙන ගෞරවත් සමඟ අප එදා සේම අදටත්, ඉදිරියටත් එම උතුම් නායකතුමා සමඟ සිටින බව වගකීමෙන් යුතුව ප්‍රකාශ කරන ලදී.

දේශපාලන පලි ගැනීම් නිසා සිදු කරන ලද මෙම ප්‍රචණ්ඩකාරී සිදුවීම් නිසා අප දේශපාලනය කිසි දිනක නතර නොකර, එමගින් පන්නරය ලබා ගෙන ඉදිරියටත් ශක්තිමත් වී අප දේශපාලන කටයුතු සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.

තිස්සමහාරාම ප්‍රදේශයට සේම, රට පුරාම දේශපාලනික වශයෙන් ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සිදු කරන ලදී. මෙවැනි සිදුවීම් ගත් කළ රටට ආදරය කරන මිනිසුන් සිටී යැයි සිතිය නොහැක. බොහෝ දුරට දේශපාලන පක්ෂය රැක ගැනීමට තම බලය රැක ගැනීමට බොහෝ පිරිස් කටයුතු කරන බව මෙම සිදුවීම් වලින් පෙනී යනු ඇත.

රට වැටී තිබෙන අවස්ථාවක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගරු අග්‍රාමාත්‍ය ධූරයේ වැඩ භාර ගැනීමට කටයුතු කිරීම අගය කරන බවත්, අතිගරු ජනාධිපතිතුමා සමඟ නව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට රට යහපත් තත්ත්වයකට පත් කර, රට ගොඩ නැගීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

- <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතාගේ අදහස් දැක්වීම</u>

ගරු සභාපතිතුමාගේ සහ ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ සහ චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවියගේ නිවෙස් සඳහා 2022.05.09 වන දින සිදු කළ ප්‍රචණ්ඩකාරී ක්‍රියාව දැඩි සේ පිළිකුල්ව හෙලා දකින බවත්, මොවුන් තම ජීවත් වීම සඳහා නිවසක් සේම වාහනද ලබා ගන්නා ලද්දේ තමන් විසින් හරි හම්බ කර ගත් මුදලින් මිසක දේශපාලනයක් මගින් නොවන බව දන්වා සිටින ලදී. එසේම කැලුම් ප්‍රියංකර මහතාගේ, ඉන්දික මහතාගේ සහ චින්තක මහතාගේ නිවෙස් සඳහා සිදු කළ හානියත් තමා දැඩි සේ හෙලා දකින බව ප්‍රකාශ කරන ලදී.

2022.05.09 වන දින තිස්ස නගර තුළ සිදු වූ සිදුවීම්, කියන ලද කතා කෑම දෙයක්ම එදින තිස්සමහාරාමයේ සිටි මා, මාගේ ඇසින් දැක, කණින් ඇසීමට හැකි විය. ජනතා විමුක්ති පෙරමුණ නායකයින් මෙකී ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්ට මුලිකත්වය ලබා දෙමින් තරුණයින්ට අයිස් මත්ද්‍රව්‍ය, මත් වතුර ලබා දී ඔවුන් කුපිත කර, විනාශ කිරීම් සිදු කිරීමට පොළඹවා යවන ලදී. මෙකී සෑම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවක්ම මෙහෙය වන ලද්දේ ජනතා විමුක්ති පෙරමුණ ගරු සභික, එල්.එච්. කුමුදු සුජීව මහතා විසින් බව දන්වා සිටින ලදී. ඔහු සමාජ මාධ්‍ය ජාලය ඔස්සේ තිස්සමහාරාමයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගෙන් ගණු දෙනු බේරා ගැනීමට කාලය පැමිණ ඇත යනුවෙන් සටහනක් තබා තිබූ බව අපට දැක ගැනීමට හැකි විය. ඔහු එම ගනුදෙණුව බේරා ගනු ලැබුවේ අප ආණ්ඩු පක්ෂයේ ගරු සභාපතිතුමා ඇතුළු ගරු සභිකයින්ගේ නිවෙස් ගිණි බත් කර, කුඩු කර දැමීම මගින් බව කිව හැකිය. එදින තිස්සමහාරාම මන්ත්‍රීවරුන්ගේ නිවෙස් විනාශ කර දමා ඉන් පසුව මාගේ නිවසටද හානි කිරීමේ බලාපොරොත්තුවෙන් සිටියද, මාගේ ගමේ ජනතාව එදා සේම අදටත් මා සමඟ සිටි නිසා මාගේ ජීවිතය සේම, නිවසත්, දේපළත් බේරා ගැනීමට හැකි වූ බව ප්‍රකාශ කරන ලදී. එම අවස්ථාවේ තම නිවස අසල සිටි පිරිසක් ගරු සභික, කුමුදු සුජීව මහතාට දුරකතන ඇමතුමක් ලබා දී ගයාන් සඳරුවන්ගේ නිවස අසල අප සිටින බැවින්, එම ස්ථානයට නොපැමිණෙන ලෙස වාර 02 කදීම

ප්‍රකාශ කළද, එහිදී කුමුදු සුජීව මහතා විසින් ප්‍රකාශ කර ඇත්තේ, අප එම ස්ථානයට අනිවාරයෙන්ම එන බවයි. නමුත්, එම පිරිස කුමුදු සුජීව මහතාට 03 වන අවස්ථාවේ දූරකතන ඇමතුම ලබා දී ගයාන් සදරුවන් මහතාගේ නිවස අසල විශාල පිරිසක් සිටින බැවින්, නොපැමිණෙන ලෙස පැවසූ පසුව එම පිරිස තම නිවස අසලට නොපැමිණි බව ප්‍රකාශ කරන ලදී.

මෙම සිදුවීම් වලදී ගෝටා ගෝ ගමේ සිදු වූ සිදුවීම ගැටළුවකි. නමුත් මෙම තිස්සමහාරාමයේ සිටින්නේ ඉතාමත් අසරණ මිනිසුන්ය. අප මෙම මහා සභාවේ දී මතවාදී ගැටුම් ඇති කර ගත්තද, තිස්සමහාරාමයේ ජීවත් වූයේ සහෝදරයින් සේය. එසේ අප සහෝදරයින් සේ සලකා කටයුතු කළ අය, මෙලෙස විනාශකාරී සිදුවීම් සිදු කලේ යැයි අප අද වන තෙක් විශ්වාස නොකරන ලදී.

ගරු සභාපතිතුමාගේ නිවස කුඩු කර දමා, නිවසේ තිබූ වාහන රැසක් කුඩු කර විනාශ කිරීමට එදින ප්‍රචණ්ඩකාරී මිනිසුන් විසින් කටයුතු කර ඇත. ගරු සභාපතිතුමා කිසි දිනක මේ දේවල් හරි හම්බ කර ගන්නා ලද්දේ දේශපාලනයකින් නොවන බවත්, ඔහුගේ ව්‍යාපාර කටයුතු වලින් ලබා ගත් මුදලින් බවත් සඳහන් කළ යුතුය.

ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාත්, ඔහුගේ බිරිඳත් ඉතාමත් දුක සේ රැකියා කරමින්, හරි හම්බ කර ගත් මුදලින් නව නිවසක් සාදා මීට පෙර මාසයක නිවසේ පදිංචි වීම සිදු කරන ලදී. ඔවුන් විසින් දුක සේ ඉදි කර ගත් නිවස ගිණි බත් කර විනාශ කර දැමීමට තරම් මෙම මිනිසුන් පාපකාරී වී ඇති බව කිව හැකිය.

එසේම ගරු සභික, චතුමිණි විජේනායක මෙනවියගේ නිවසද කුඩු කර දමා විනාශ කිරීම මගින් මෙම ජනතාව කුමන සතුටක් ලබන්නේද යන්න සිතිය නොහැක. මෙම සෑම ක්‍රියාවක්ම ඔවුන් සඳහා පමණක් නොව අප සියලුම දේශපාලන නියෝජිතයින් වෙත සිදු කරනු ලැබූ දේවල් ලෙස සඳහන් කළ යුතුය.

2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සියල්ලම මෙහෙය වන ලද්දේ අප සභාවේ, ගරු සභික, එල්.එච්. කුමුදු සුජීව මහතා විසින්ය. අප සභාව තුළ එතුමාටත්, අනෙක් පක්ෂවල ගරු සභිකයින්ටත් කිසිදු වෙනසක් නොමැතිව සමසේ සිතා කටයුතු කරන ලදී. සභාවේ සහෝදරයන් සේ හිඳ, එම සහෝදරයන්ටම මෙවැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් කෙසේ සිදු කලේද යන්න අදටත් සිතා ගත නොහැක. මෙවැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සිදු කර, රට කිසි දිනක ගොඩ නැගිය නොහැක. මෙවැනි ක්‍රියාවන් නතර කර, අප සියලුම දෙනා එකට එක්ව කටයුතු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

තිස්සමහාරාම පුරවරයේ මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්, අරගලකාරී තත්ත්වයන් ප්‍රචාරය කරන ලද්දේ තිස්සමහාරාම යන සමාජ මාධ්‍ය ජාලය විසින්ය. මෙය ක්‍රියාත්මක කරන අයද නීති රැහැනට හසු කර ගත යුතුය. එසේම මෙම සමාජ මාධ්‍ය ජාලාවලින් සිදු කරන ක්‍රියාවන්ද දැඩි සේ හෙලා දකින බව ප්‍රකාශ කරන ලදී.

2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවේදී මා වෙනුවෙන් පෙනී සිට, සොයා බැලීම් සිදු කළ සියලුම දෙනාට ස්තූතිය පුද කරන ලදී. එසේම මෙවැනි අවස්ථාවකදී දූරකතන ඇමතුමක් ලබා දී හෝ ඒ සම්බන්ධයෙන් සොයා බැලීමක් සිදු නොකල පිරිස සම්බන්ධයෙන් තමා කණගාටු වන බවත් ප්‍රකාශ කරන ලදී.

මෙම ප්‍රචණ්ඩකාරී සිදුවීම් දිනයේ දී තම මවගේ ඇස් වලින් කඳුලු වැටෙද්දී මා හට එය දරා ගැනීමට නොහැකි විය. මෙවැනි විනාශකාරී, පාපකාරී ක්‍රියාවන් මිනිසුන් විසින් කෙසේ සිදු කලේද යන්න සිතා ගත නොහැක. මෙම සිදුවීම් වලට සම්බන්ධ සියලුම පුද්ගලයින්ට විපාක ලැබිය යුතුය. නීතියෙන්ද දඩුවම් ලබා දිය යුතුය. මෙම සියලු සිදුවීම් හමුවේ ජනතා විමුක්ති පෙරමුණ දැඩි සේ හෙලා දිකන බවත්, 2022.05.09 වන දින තිස්සමහාරාමයේ සිදු වූ සියලුම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සඳහා ජනතා විමුක්ති පෙරමුණ අනිවාරයෙන්ම වගකිව යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, චතුමිණී දිල්ෂාණී විජේනායක මෙනවියගේ අදහස් දැක්වීම</u>

2022.05.09 වන දින සිදු වුයේ ඉතාමත් ප්‍රචණ්ඩකාරී සිදුවීමකි. තිස්සමහාරාම ජනතාව තම දේශපාලන පටු අරමුණු පෙරටු කර ගෙන, ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයද මූලිකත්වය ලබා දෙමින් මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සිදු කරන ලදී. ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ පෙර ඈත අතීතයේ සිදු වූ භීෂණ තත්ත්වයක්ම වර්තමානයේ ද සිදු වූ බවත්, එම භීෂණ තත්ත්වය වර්තමානයේ ද තමාට නිවසේ සිටම දැක ගැනීමට හැකි වූ බවත් ඉතාමත් දුක්ඛිතව සඳහන් කළ යුතුය.

රට තුල ඇති වූ අර්බුධකාරී තත්ත්වය සියලුම දෙනා එක්ව විසදාගැනීම කළ යුතුව තිබියදී, මාස ගණනක් රට අරාජිත කිරීමට මෙම අරගලකාරීන් කටයුතු කරනු ඇත.

රට තුළ සිදු වූ මෙකී තත්ත්වය හමුවේ අධ්‍යාපන කටයුතු, රාජ්‍ය සේවය සේම අනෙකුත් සියලුම කටයුතු බිඳ වැටී ඇත. රටේ ජනතාව විසින් සිදු කරන ලද මෙම ප්‍රචණ්ඩකාරී තත්ත්වය නිසා රට ගොඩ නැගීමට හැකි වුයේ නම්, එක් අතකින් අපට සතුටු විය හැකිය. නමුත් එසේ නොවී රට තව තවත් අයහපත් තතත්වයට පත් විය. තිස්සමහාරාම ජනතාවට සේවයක් කිරීමේ දී පාට පක්ෂ භේද නොබලා කටයුතු කළ අප හට සිදු වූ මෙම විනාශකාරී තත්ත්වය සිතා ගැනීමට අදටත් නොහැකි වී ඇත. යම් යම් සිද්ධීන් අප හඳුනන පුද්ගලයින් විසින් අපට දැනුම් දුන්නද, තිස්සමහාරාම පුරවරයේ ජනතාව කිසි දිනක මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදු කිරීමට පෙළඹේ යැයි කුමන අවස්ථාවක හෝ මා නොසිතන ලදී. යම් පුද්ගලයින් පිරිසක් මෙසේ විනාශකාරී ක්‍රියාවන් සිදු කළත්, ඒ අතර මනුස්සකම තිබෙන උතුම් මිනිසුන් දෙදෙනෙක් ක් පැමිණ නංගි නුඹ නිවසින් පිටව ගොස් ආරක්ෂාව සලසා ගන්න යැයි ප්‍රකාශ කරන ලදී. එම පාපකාරී මිනිසුන් අතර අප පිළිබඳව සොයා බැලීම් කළ එම සියලු දෙනා වෙනුවෙන් ද තමා ස්තූතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදී. එසේම මෙම සිදුවීම්වලට අප හා කතා බස් කරන, අපගේ උදව් උපකාර ලබා ගත් මිනිසුන්ද සිටි බව කණගාටුවෙන් ද දන්වා සිටින ලදී.

අප සභාවේ සහෝදරයින් සේ සලකා එකට සිටි ජනතා විමුක්ති පෙරමුණ ගරු සභිකයින් අප හට මෙසේ සිදු කලේ කෙසේද යන්න අදටත් හීනයක් වී ඇත. අප සහෝදරයින් සේ සිතුවත්, දේශපාලනික පටු අරමුණු ඉටු කර ගැනීමේ අරමුණින් ඔවුන් මෙවැනි විනාශකාරී සිදුවීම් සිදු කර ඇති බව කිව හැකිය. අප දේශපාලනය අතින් වැරදි රට ගොඩ නැගීමට හැකි නම්, අප නිවාස, දේපළ විනාශ කළත් එමගින් සතුටක් විඳිය හැකිය. නමුත් අද වන විට එය එසේ නොවී, රට තව තවත් අයහපත් තත්ත්වයකට පත් වී ඇත. එම නිසා මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් නතර කර, අප සියලුම දෙනා එකට එක්ව රට ගොඩනැගීමට කටයුතු කළ යුතුය.

එසේම සාමාජ මාධ්‍යජාලා තුළින් යම් යම් සිදුවීම්, යම් යම් අදහස් දක්වා අප මානසික අතින් වට්ටවන ලද අවස්ථාවන්ද බොහෝ තිබුණි. එම අවස්ථාවන්වලින් අප මානසිකව වැට්ටවීමට කටයුතු කළත්, රට දැය බේරා ගැනීමට කටයුතු කළ අප අතිගරු ජනාධිපති, දැනට ගරු අග්‍රාමාත්‍ය ධූරට දරණ මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ අප එදා සේම අදටත්, ඉදිරියටත් සිටින බව විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කරන ලදී.

මෙම නිවාස විනාශ කර දැමීම සඳහා යවන ලද පිරිස, ඔවුන් කුමක් කිරීම සඳහා යන්නේද යන්න අරමුණක්වත් නොදන්නා තරමට ඔවුන්ට මත් ද්‍රව්‍ය, මත් වතුර ලබා දී ඔවුන් ඒ සඳහා යොමු කර ඇති බව කිව හැකිය. එම නිසා මෙකී සිදුවීම් මෙහෙයවීමට කටයුතු කළ, මහ මොලකරුවන් මේ වන විට සැංගී ඇති බැවින්, ඔවුන් අනිවාරයෙන්ම අල්ලා නීතියේ රැහැනට අසු කර දීමට කටයුතු කළ යුතු බව මා ඉතාමත් ආයාචනයෙන් යුතුව ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

තිස්සමහාරාම තුළ 09 වන දින සිදු කළ ලද අපරාධයක් නැවත මේ තිස්සමහාරාමයේ සිදු වීමට ඉඩ දිය නොහැක. නැවත එසේ සිදු වුවහොත් අප සියලුම දෙනා ඒ වෙනුවෙන් නැගී සිට කටයුතු

කළ යුතුය. පටු දේශපාලන අරමුණු සඳහා තිස්සමහාරාම පුරවරය රැගෙන යාමට ඉඩ නොදී අප සියලුම දෙනා නැගී සිට කටයුතු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී. එසේම දේශපාල පක්ෂයකින් හෝ වෙනත් පුද්ගලයින් කිසිවෙක් විසින් මින් ඉදිරියට තිස්සමහාරාමයේ අරගල කිරීමට ඉඩ නොදිය යුතු බවත් දන්වා සිටින ලදී.

ගරු සභාපතිතුමාටත්, ගරු සභික ඩබ්.කේ. ටෂිත සමිල මහතාටත්, මා හටත් සිදු වූ විනාශකාරී තත්ත්වය තවත් කිසිදු පුද්ගලයෙකුට සිදු නොවේවායි ප්‍රාර්ථනා කරන අතර, මෙම සිදු කරන ලද විනාශකාරී ක්‍රියාවන්වලට සම්බන්ධ සියලුම පුද්ගලයින්ට එල විපාක ලැබෙන අනිවාරයෙන්ම ලැබෙනු ඇත. එසේම අප සියලුම දෙනාට සාධාරණයක් ලැබීමට නම් මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවේ මහ මොලකරුවන් නීතියේ රැහැනට අනිවාරයනේම අසු කර දීමට අප මැදිහත් වී කටයුතු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

- ✓ **මහා සභාව විනාඩි 10 කට කල් ලබන ලදී. (ප.ව. 12.10)**

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ අදහස් දැක්වීම</u>**

2022.05.09 වන දින සිදු වූ සිදුවීම් වලින් ගරු සභාපතිතුමාගේ සහ ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ සහ චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවියගේ නිවෙස් සඳහා සිදු වූ හානියට මාගේ කණගාටුව පල කරන ලදී. එසේම මෙම සිදුවීම සංවේදී ප්‍රශ්නයක් බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ අදහස් දැක්වීම</u>**

2011 වර්ෂයේ සිට මා මෙම සභාව නියෝජනය කරමින් මහජන නියෝජිතයෙක් ලෙස ජනතාව වෙනුවෙන් සේවය කර ඇත. එම වර්ෂයන් වලදී කිසි දිනක මා අද දින ලෙස අවේගශීලීව කටයුතු කර නොමැත. 2022.05.09 වන දින සිදු කරන ලද ප්‍රචණ්ඩකාරී ක්‍රියාව හේතුවෙන් මා අලුතින් සකසා ගත් නිවස ගිණි බත් කර දැමීමට කටයුතු කර ඇත. මෙම සිද්ධිය ඉවසා දරා ගැනීමට බැරි නිසාම මා එලෙස අවේගයෙන් යුතුව කටයුතු කළ බව සඳහන් කරන ලදී. මා මීට මාස 02 කට පෙර මෙම සභාවේදීම මාගේ නව නිවසේ පදිංචිවීමේ සතුට බෙදා ගැනීම සඳහා සියලුම දෙනාට ආරාධනා කරන ලදී. නමුත් මාස 02 ක් හෝ නික්ම වීමට පෙර මා සහ මාගේ බිරිද දුක් මහන්සි වී සකස් කර ගත් නිවස ගිණිබත් කර දැමීමට තරම් පාපකාරී මිනිසුන් කටයුතු කර ඇත. මෙම දුක මා කෙසේ නම් විද දරා ගන්නේද. මා මේ අවස්ථාවේ සිටින්නේ ඉතාමත් අසරණ දුක්ඛිත තත්ත්වයකින්ය. ඒ හේතුව නිසාම මා අද ඉතාමත් අවේගයෙන් යුතුව කටයුතු කළ බව කණගාටුවෙන් සඳහන් කරන ලදී.

අප සභාවේම සහෝදරයින් ලෙස ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ ගරු සභිකයින්ද කටයුතු කළත්, මෙවැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් ඔවුන් කෙසේ සිදු කලේද යන්න තවමත් සිතා ගත නොහැක. මාගේ දරු පැටව් මේ වන විට ඉතාමත් දැඩි සේ අසරණභාවයකට පත්ව ඇත. මාගේ දරුවන්ටත්, මාගේ පවුලේ සාමාජිකයින්ටත් මේ වන විට ඇදිවත පමණක් ඉතිරි වී ඇත. මාගේ දරුවන්ගේ ඇඳුම්, පොත්පත් සියල්ල පිච්චි ගොස් ඇත. මාගේ දරුවන් අසන ලද ප්‍රශ්නවලට, දරුවන්ගේ දේවල් ඉල්ලීමේ දී මා එම දරුවන්ට කුමක් පවසන්නද. මෙම පාපකාරී මිනිසුන් කෙසේ මෙලෙස නිවසක් ගිණි බත් කරන්නට ඇත්ද යන්න සිතා ගත නොහැක.

ජනතා විමුක්ති පෙරමුණ මූලික කර ගනිමින් මෙම සිදු කළ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සඳහා පිරිස් සංවිධානය කළ මහ මොලකරුවන් නීතියේ රැහැනට අසු කර දිය යුතුය. මේ සඳහා මූලික වෙමින් කටයුතු කර ඇති ගරු සභික, කුමුදු සුජීව මහතාටත් නීතියේ රැහැනට අසු කර දිය යුතු බවත්, ඔවුන් මෙම සිදු කළ විනාශකාරී ක්‍රියාවන්ට එල විපාක අනිවාරයෙන්ම ලැබෙන බවත් ප්‍රකාශ කරන

ලදී. එසේම ඔවුන්ට ද අපට දැනුණු වේදනාව, දුක විඳීමට සිදු විය යුතුය. එසේම මේ සඳහා විපාක මෙලොවදීම ලැබිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

එසේම මෙම ප්‍රදේශයේ තිබෙන හයස්ටඩි, දිසාපා අධ්‍යාපන ආයතන තුළින් දරුවන්ගේ මනස දේශපාලනීකරණය කර විකෘති කර ඇත. මෙම උපකාරක පන්ති වහාම නතර කර දැමීමට කටයුතු කළ යුතුය. මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සඳහා බෙහෙවින් සම්බන්ධ වී ඇත්තේ මෙම උපකාරක පන්ති සඳහා සහභාගී වන අධ්‍යාපනය ලබන දරුවන්ය. අධ්‍යාපනය හැදෑරීමට පැමිණෙන දරුවන් දේශපාලනයට සම්බන්ධ කර ගැනීම මොවුන් කරන පාපකාරී ක්‍රියාවක්ය. මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සියල්ල මෙහෙය වන ලද්දේ ගරු සභික, එල්.එච්. කුමුදු සුජීව මහතා විසින්ය. මෙම මහ මොලකරු කඩිනමින් සොයා නීතියේ රැහැනට අසු කර දිය යුතු බව ප්‍රකාශ කරන ලදී. එසේම මෙම සිදු වූ සිදුවීම් සියල්ල දැඩි සේ පිළිකුල් සහගතව හෙලා දකින බව ප්‍රකාශ කරන ලදී.

මා හට සේම, ගරු සභාපතිතුමාටත්, ගරු සභික, චතුමිණි දිල්ෂාණි මෙනවියගේ නිවෙස් සඳහාත් සිදු වූ හානිය වෙනුවෙන් අප සියලුම දෙනාට සාධාරණය ඉටු වේවායි බලාපොරොත්තුවෙන් සිටින බව ප්‍රකාශ කරන ලදී. පටු දේශපාලන අරමුණු වෙනුවෙන් සිදු කරන ලද දේශපාලන මාපියාවන් වහාම නතර කිරීමට කටයුතු කළ යුතුය. එසේම මෙවැනි සිදුවීම් ඉදිරියට තිස්සමහාරාමයේ සිදු නොවීමට විපක්ෂ නායකතුමා ඇතුළුව සියලුම ගරු සභිකයින් වග බලා ගන්නා ලෙසට ඉල්ලා සිටින ලදී.

මාගේ නිවස ගිණිබත් කිරීම මෙම පාපකාරී මිනිසුන් සිදු කළත්, මෙවැනි දෙයක් වනේ වන හතුරෙකුටවත් සිදු නොවේවායි මා ප්‍රාර්ථනා කරමි. මෙවැනි සිදුවීම් තුළින් මාගේ දේශපාලනය නතර කිරීමට සිතන්නේ නම්, එය කිසි දිනක සිදු නොවන දෙයකි. මාගේ මෙම දේශපාලනය නිසා කිසි දිනකත් මා මාගේ රට, ගම, ප්‍රාදේශීය සභාව අත්හැර නොයනු ඇත.

මාගේ නිවස ගිණිබත් කළ සියලුම දෙනාටත්, මෙහි මහ මොලකරුටත් වහාම නීතිය ක්‍රියාත්මක කළ යුතුය. එසේ නොමැතිව මෙහි මහමොලකරුවන් සැංගී සිට, ඔහුට මේ සඳහා නීතිය ක්‍රියාත්මක නොකලහොත්, මා මාගේ දරුවන් දෙදෙනාත්, බිරිඳත් සමඟ මහ පාරේ උපවාස කිරීමට අනිවාරයෙන්ම කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතාගේ අදහස් දැක්වීම</u>**

දේශපාලනය ගත් කළ ඉදිරියටත් දේශපාලනය සිදු කළ නොහැකි තරමට පිළිකුල් සහගත වී ඇත. 2011 වර්ෂයේ සිට ගරු සභික, ටෂිත සමිල මහතා ඇතුළුව අප සභාව නියෝජනය කර ඇත. එසේ නියෝජනය කළ වර්ෂයන්වලදී කිසි දිනකත් මෙවැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සිදු කර නොමැත. දේශපාලන පක්ෂ, මතවාද, අදහස් කුමක් වුවත් අප සියලුම දෙනා මෙම සභාව තුළ එකට එක්ව කටයුතු කරන ලදී. අප සභාව නියෝජනය කර, එහි අදහස් දක්වන්නේ ප්‍රදේශයේ ජනතාවට සේවයක් සිදු කිරීම සඳහාය. එසේ නොමැතිව මෙවැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් කිසි දිනකත් සිදු කර නොමැත. පක්ෂයන් තුළ ගැටීම්, මතවාද ඇති වුවත් නිවෙස් කුඩු කර, ගිණි බත් කිරීම් අපට කිසි දිනක සිදු කළ නොහැක. අප සභාව නියෝජනය කරන සියලුම ගරු සභිකයින් තමන්ට හිසට සෙවනක් සඳහා නිවසක් සාදා ගැනීම සිදු කර ඇත්තේ රැකියාවන් සිදු කළ හෝ ව්‍යාපාරයන් සිදු කර දුක් මහන්සියෙන් හම්බ කර ගත් මිල මුදල් වලින්ය. පාර්ලිමේන්තුමේන්තුවේ දේශපාලනඥයින් සොරකම් සිදු කරන බවට යම් යම් අදහස් තිබුණත්, අප ගරු සභිකයින් කිසි දිනක වංචාවක්, සොරකමක් සිදු කර නොමැති බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා නව නිවසක් සාදා එම නිවසේ පදිංචිවීමේ සතුට බෙදා ගැනීමට අපටද කළ ආරාධනයට, එදින මාද ඒ සඳහා සහභාගී වන ලදී. එදා ඉතාමත් අලංකාරවත් ලෙස තිබූ නිවස ගිණිබත් වූ ආකාරය දෙස බැලීමේදී ඉතාමත් දුකක් සහ කණගාටුවක් මා සිත තුළ

ඇති විය. කුමන පක්ෂය වුවත් සභාව තුළ අප සියලුම ගරු සභිකයින් සහෝදරයින් ලෙස කටයුතු කරන ලදී. නමුත් එසේ සහෝදරයින් ලෙස කටයුතු කළ ගරු සභිකයින්ම මෙවැනි විනාශකාරී ක්‍රියාවක් සිදු කිරීම සිතා ගත නොහැක. දේශපාලනය වශයෙන් අර්බුධකාරී තත්ත්වයක් තිබුණත් මේ දක්වා මෙවැනි විනාශකාරී ක්‍රියාවන් කවදාවත් සිදු නොකර ඇති බවත්, මෙම සිද්ධීන් ඉතාමත් පිළිකුල් සහගතව හෙලා දකින බවත් ප්‍රකාශ කරන ලදී.

ආණ්ඩු පක්ෂයේ ගරු සභිකයින්ට සිදු වූ විනාශකාරී සිදුවීම් හමුවේ යම් අවේගශීලීත්වයක් ඇති වුවත්, විනාශකාරී ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් ඇති කර නොගැනීම සතුටු විය හැකි කරුණක් බව ප්‍රකාශ කරන ලදී.

පත් වූ නව අගමැති සමඟ එකතු වී රටේ ආර්ථික අර්බුධය සඳහා විසඳුම් ලබා ගනිමින් යහපත් ලෙස රට ඉදිරියට ගෙන යාමට හැකි වේවායි ප්‍රාර්ථාන කරන ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, හර්ෂ ජයවීර මහතාගේ අදහස් දැක්වීම</u>

2011 වර්ෂයේ සිට මා මෙම සභාව නියෝජනය කරමින් කටයුතු කර ඇත. එම කාලය තුළ ගත් කල අද ඇති වුයේ එදාවත් නොතිබුණු උණුසුම් තත්ත්වයකි. 1988 / 1989 කාලයේ දී ඇති භීෂණ තත්ත්වයක් අද වර්තමානයේද උදා වී ඇති බව කිව හැකිය. අප දේශපාලනය සිදු කරනු ලබන්නේ අපගේ පුරවරයේ ජනතාවට සේවයක් කිරීමටය. නමුත් මෙවැනි සිදුවීම් ගත් කළ ඉදිරියට දේශපාලනයෙන් සමුගන්නා ලෙසට නිවෙස්වලින්ද අප හට කියනු ලබයි. අද කාලයේ සේම ජනතා විමුක්ති පෙරමුණ භීෂණ කාලයේද පොඩි දරුවන් පවා එකී කටයුතු සඳහා සම්බන්ධ කර ගෙන ඇත. මෙවැනි භීෂණකාරී ක්‍රියාවන් වහාම නතර කළ යුතුය. එම නිසා අප සියලුම දෙනා එක්ව ඉදිරියට මෙවැනි ක්‍රියා සිදු නොවීමට වග බලා ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

2022.05.09 වන දින සිදු වූ සිදුවීම් වලින් ගරු සභාපතිතුමාගේ සහ ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ සහ චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවියගේ නිවෙස් සඳහා සිදු වූ හානියට මාගේ කණගාටුව පල කරන ලදී.

බොහෝ සමාජ මාධ්‍ය ජාලා ද මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සඳහා සහාය ලබා දී කටයුතු කර ඇත. සමාජ මාධ්‍ය ජාලා ක්‍රියාත්මක කරන අයටද, ඒවා නියමාකාරයෙන් ක්‍රියාත්මක වන ආකාරයේ වැඩපිළිවෙලක් සංවිධානය කිරීමට හැකි නම් එය වඩාත් යෝග්‍ය වන බව ප්‍රකාශ කරන ලදී.

තිස්සමහාරාමය යනු ඓතිහාසික උතුම් පුරවරයකි. එම පුරවරයේ සියලුම ජනතාවට හෙට දවසේ හොඳ දවසක් උදා වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතාගේ අදහස් දැක්වීම</u>

ඉතාමත් කණගාටු තත්ත්වයකින් අද දින මහා සභාවේ අප සියලුම දෙනාට කටයුතු කිරීමට සිදුව ඇත. රටේ ඇති වී තිබෙනන තත්ත්වයට ක්‍රියා කරන ආකාරය ගත් කළ ඇති වන්නේ දුක්ඛදායක තත්ත්වයකි.

2022.05.09 වන දින සිදු වූ සිදුවීම් වලින් ගරු සභාපතිතුමාගේ සහ ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ සහ චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවියගේ නිවෙස් සඳහා සිදු වූ හානියට මාගේ හදවතින්ම මා කණගාටුව ප්‍රකාශ කරන ලදී. මෙකී සිදුවීම් සිදුවන අවස්ථාවේ ගරු සභාපතිතුමා වෙත දුරකතන ඇමතුමක් ලබා දී එතුමන්ලාගේ ආරක්ෂාව සලසා ගැනීමටත්, නිවෙස් සඳහා ආරක්ෂාව සැලසීමට කටයුතු කරන ලෙසත් දන්වන ලදී. එසේම ලේකම්තුමියට දුරකතන ඇමතුමක් ලබා දී ප්‍රාදේශීය සභාවේ ආරක්ෂාව සඳහා සභාව වසා දැමීමට කටයුතු කරන ලෙසටත් දන්වන ලදී. එසේම

හැකි පමණින් ආරක්ෂක අංශ වෙත ද දන්වා තිස්සමහාරාමයේ ද ආරක්ෂාව සැලසීමට කටයුතු සලසන ලදී.

2022.05.09 වන දින තිස්සමහාරාම නගර මධ්‍යයේ සිදු වු සිදුවීමේ දී, අරගලයට එහා ගිය සිදුවීම් කිහිපයක් දැක ගැනීමට හැකි විය. එහිදී යතුරු පැදිවලින් තරුණ පිරිසක් ඉතාමත් අවේගයෙන් යුතුව කටයුතු කරන ආකාරය පිළිබඳ දැක ගැනීම ඉතාමත් සංවේදී පුද්ගලයෙක් ලෙස එය මා හට දරා ගැනීමට නොහැකි සිද්ධියක් විය.

තමා විපක්ෂ නායක ලෙස කටයුතු කළද, ගරු සභාපතිතුමාගේ නිවස කුඩු කර දමා ඇති බව දැන ගත් මොහොතේ එම සිදුවීම තමා කම්පනයට පත් කරන ලදී. එය දැන ගත් පසුව තමාගේ මතකයට පැමිණියේ 1988-1989 වර්ෂයන් හි සිදු වු භීෂණ තත්ත්වයයි. මෙම සිදු වු සිදුවීම් මානව සන්හතියටම නොගැලපෙන සිදුවීම්ය. රටේ ආර්ථික තත්ත්වයන් සඳහා විසඳුම් ලබා ගැනීමට අරගල කිරීම හොඳ දෙයක් වුවත්, ඒවා පෙරටු කර ගනිමින් වෛරී සහගත සිවිලි ඉටු කර ගැනීම ඉතාමත් වැරදි ක්‍රියාවක් බව සඳහන් කරන ලදී.

පසුගිය දිනයන්වල රටේ ආර්ථික තත්ත්වය හමුවේ දින කිහිපයක් අරගල තත්ත්වයන් තිබුණද, තමා එම කිසිදු අරගලයක් සඳහා සම්බන්ධ නොවුයේ, එම අරගල පසුපස තිබුණේ වෙනත් පටු දේශපාලන අරමුණු නිසාය. මෙම සිදුවීම් ගත් කළ අතීතයේ භීෂණ තත්ත්වයන් තමා හට සිහිපත් වන ලදී. එදා ඇති වු භිෂණ තත්ත්වය සේම අද වර්තමානයේ ද ඇති වු භිෂණ තත්ත්වය එදා සේම අදටත් හෙලා දකින බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුතමා යනු හොද පියෙක්, හොද නායකයෙක් සේම හොද මනුස්සයෙක් ලෙස දැක්විය හැකිය. එතුමන් කිසිදු වංචාවක් සිදු නොකර, දැතේ වීරියෙන් තමන් දහඩිය මහන්සියෙන් උපයා ගත් මුදලින් තම නිවෙස්, දේපළ සපයා ගෙන ඇති බවත්, ඒ කිසිවක් දේශපාලනය මගින් උපයා ගත් දේවල් නොවන බවත් තමාද දන්නා කරුණකි.

එසේම ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා සහ ඔහුගේ බිරිද කිසිදු වංචා ක්‍රියා නොකර, තම රැකියා වලින් හම්බ කර ගත් මුදලින් අලුත් නිවසක් ඉදි කර ගත්තද, එක් දිනකින් එය ගිණි බත් කර දැමීමට තරම් ප්‍රචණ්ඩකාරී පුද්ගලයින් පාපතර වී ඇත.

ගරු සභික, චතුමිණි දිල්ෂානි මෙනවියගේ ද නිවස එදින විනාශ කිරීමට කටයුතු කළද, එම නිවසද එතුමියගේ පියා සිදු කරන ලද රැකියාවෙන් හරි හම්බ කර ගත් මුදලින් සකස් කර ඇති බවත්, දේශපාලනයෙන් ලබා ගත් දෙයකින් එකී කිසිවක් සිදු කර නොගෙන ඇති බවත් සඳහන් කළ යුතුය.

එක රටක් තුළ එක් නීතියක් ක්‍රියාත්මක වන්නේ නම්, 2022.05.09 වන දින රට පුරාම මැති ඇමතිවරුන්ගේ මෙන්ම ගරු සභිකයින්ගේද නිවෙස් විනාශ කර දැමීමට සම්බන්ධ සියලු පුද්ගලයින් නීතියේ රැහැනට අසු කර ගත යුතු බව ප්‍රකාශ කරන ලදී. එසේම රට ආරක්ෂා කිරීම සඳහා සේණාධිපතිවරයා දුන් නියෝගය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළේ නම්, රටේ ආරක්ෂාව මෙලෙස අනාරක්ෂිත නොවන බවත් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී.

දේශපාලනය සිදු කිරීමේ දී පාට පක්ෂ කෙසේ වුවත්, අප සියලුම දෙනා තුළ මනුස්සකම තිබිය යුතුය. 1988-1989 වර්ෂයන්වල පැවතුණු භිෂණ තත්ත්වයක් නැවත වර්තමානයේ ද ගෙන ඒමට කටයුතු කරන්නේ නම්, ඒ වෙනුවෙන් නැගී සිට තමා කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී. එසේම තිස්සමහාරාමයට මෙවැනි භිෂණ තත්ත්වයක් මින් ඉදිරියට ඇති වීමට ඉඩ නොදිය යුතුය. උපකාරක පන්ති අතරේ දේශපාලනය සිදු කිරීමට උගන්නවන පන්ති වහාම නවතා දැමීමට කටයුතු කළ යුතුය. මේ සඳහා අපද දැඩි සේ විරුද්ධ බව සඳහන් කරන ලදී.

නැවත වතාවක් ලේ විලක් කිරීමට පෙළඹෙන්නේ ලේ පිපාසාවෙන් සිටින අයයයි. එම නිසා මෙම සිදුවීම් පිළිබද දැඩි විමසිල්ලෙන් යුතුව කටයුතු කළ යුතු බවත්, මෙකී සියලු සිදුවීම්වලට සම්බන්ධ සියලු දෙනාට නීතිය ක්‍රියාත්මක කළ යුතු බවත් දන්වා සිටින ලදී.

එක රටත් තුළ එක නීතියක් ක්‍රියාත්මක කරන්නේ නම්, සිදු වූ විනාශකාරී සිදුවීම් වලට සාධාරණයක් ඉටු කර දිය යුතුය. එසේම විශ්වය විසින් මේ සඳහා විපාක අනිවාරයෙන්ම මෙම පාපකාරී මිනිසුන්ට ලබා දෙනු ඇත.

එසේම සෑම දේශපාලන පක්ෂයක්ම කැලෑ වදින්නේ නැතිව දේශපාලනය කළ යුතුය. ඇතැම් දේශපාලන නායකයින්ගේ ක්‍රියාවන්වලින් විපාක ලැබීමට සිදු ඇත්තේ අසරණ ජනතාව වෙත බවත් සඳහන් කළ යුතුය.

රට තුළ ඇති ව්‍යවසන තත්ත්වය නිසා මහජන නියෝජිතයින්ට පාරේ බැස යාමට නොහැකි තත්ත්වයක් උදා වී ඇත. තිස්සමහාරාම අරගලය වුණු අවස්ථාවේ එම මිනිසුන් වෛරී සහගත ලෙස කටයුතු කළ බව සිදු වූ සිදුවීම් වලින් වටහා ගත හැකිය. මෙකී සිදුවීම් වලට සම්බන්ධ සියලුම පුද්ගලයින්ට කතරගම දෙවියන්ගෙන්, භද්‍ර කාලි මෑණියන් ඇතුළු සියලුම දෙවිවරුන්ගෙන් සාපය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

වර්තමානයේ වූ මෙම ප්‍රචණ්ඩකාරී සිදුවීමක් රට තුළ ඉදිරියට සිදු නොවේවායි සහ රට සුවපත් රටක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

එසේම රට මෙවැනි ව්‍යවසනයකට පත්ව ඇති අවස්ථාවේ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් ගරු අග්‍රාමාත්‍ය ධූරයේ වැඩ භාර ගෙන, රට සුවපත් කිරීමටත් රට ගොඩ නැගීමටත් ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන අතර, කොන්දේසි විරහිතව නව අග්‍රාමාත්‍යතුමාට තමා ඇතුළු කණ්ඩායම සහාය ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී.

- ❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, පී.එල්. වාලි ගුණරත්න මහතාගේ අදහස් දැක්වීම</u>**

අද දින අප ආණ්ඩු පක්ෂයේ ගරු සභිකයින් කිහිපදෙනෙක් සඳහා සිදු කළ විනාශකාරී තත්ත්වය හේතුවෙන් ඔවුන් අද දින ඉතාමත් වේදනාකාරී තත්ත්වකින් කටයුතු කරනු ලබයි. හයස්ටඩ් උපකාරක පන්තිය මගින් ළමුන් හට අධ්‍යාපන ලබා දීම වෙනුවට ළමුන් දේශපාලනය සඳහා යොමු කරනු ලබයි. මෙකී සෑම දෙයක්ම සිදු කරනු ලබන්නේ දේශපාලන පටු අරමුණු හේතුවෙන් බව කිව හැකිය. මෙවැනි උපකාරක පන්ති සඳහා ළමුන් යොමු කිරීමෙන් ළමුන්ගේ මනස විකෘති කරනු ඇත. එම නිසා මෙවැනි උපකාරක පන්ති වහාම නවතා දැමීමට කටයුතු කළ යුතුය.

1971 වර්ෂයේ ඇති කැරැල්ල ඇසින් දුටු අද සභාවේ සිටින එකම පුද්ගලයා මම විය හැකිය. එම භිෂණ කාලයේ මිනිසුන්ට ඉතාමත් දුක් වේදනා දී මරා දැමීමේ කටයුතු සිදු කරන ලදී. එම කාලයේම සිදු වූ භිෂණ තත්ත්වයක් අද වර්තමානයේ දී සිදු වූ බව සඳහන් කළ යුතුය. 1971 වර්ෂයේ සේම, 2022.05.09 වන දිනත් සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාව ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය විසින් සිදු කල ක්‍රියාවන් බව සඳහන් කළ යුතුය.

ගරු සභාපතිතුමා, ගරු සභික ටෂිත සමිල මහතා, චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවිය සඳහා ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය විසින් සිදු කළ නිවාස, දේපළ හානිය තමා දැඩි සේ පිළිකුල් කරන බව ප්‍රකාශ කරන ලදී. මොවුන් සියල්ලම තම නිවාස, වාහන හරි හම්බ කර ගන්නා ලද්දේ ඔවුන් විසින් සිදු කරන ලද රැකියා, ව්‍යාපාරික කටයුතු වලින් ලබා ගත් මුදල් වලින් මිසක ඔවුන් දේශපාලනයෙන් කිසිවක් හරි හම්බ කර ගෙන නොමැති බව තමා දන්නා කරුණකි. එසේම මොවුන් සියලු දෙනා ඔවුන්ගේ නිවාස, වාහන ලබා ගන්නා ලද්දේ බැංකු ණය ලබා ගනිමින් බවත් මා දන්නා කරුණකි. යම් කෙනෙකු විසින් නිවසක් සාදා ගන්න් ලද්දේ ඉතාමත් දුක් මහන්සියෙන් බව ඕනෑම

කෙනෙක් දන්නා කරුණකි. එම නිසා මෙකී සිදු වීම් සම්බන්ධ සියලුම දෙනාට ස්වභාව දහමෙන් එල විපාක කෙදිනක හෝ ලැබෙන බව අප සියලුම දෙනා දන්නා කරුණකි.

2022.05.09 වන දිනත් සිදු වූ ප්‍රචණ්ඩකාරී හේතුවෙන් ගරු සභාපතිතුමාගේත්, ගරු සභික ඩබ්.කේ. ටසිත සමිල මහතාගේත්, චතුමිණී දිල්ෂාණි විජේනායක මෙනවියගේත් නිවෙස් සඳහා සිදු වූ හානියට මාගේ කණගාටුව ප්‍රකාශ කරන බව දන්වන ලදී. එසේම ගරු සභාපතිතුමා යනු පක්ෂ විපක්ෂ සියලුම ගරු සභිකයින්ට එකසේ කටයුතු කර ඇති හොඳ නායකයෙකි. එලෙස ගරු සභිකයින් සියලු දෙනා සමසේ සලකා කටයුතු කළ නායකයෙක්ටත් මෙවැනි විනාශයක් ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය විසින් සිදු කිරීම දැඩි සේ හෙලා දකින බව ප්‍රකාශ කරන ලදී.

රටට මේ වන විට පත්ව ඇති තත්ත්වය පිළිබඳ සිතා, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අග්‍රාමාත්‍ය ධූරයේ වැඩ භාර ගැනීම වෙනුවෙන් ස්තුතිය පුද කරන ලදී. එතුමා එම ධූරයට පත්වීමත් සමඟ විදෙස් රටවලින් ආධාර ලබා ගැනීමේ හැකියාවද ඉදිරියේ පවතින බව ප්‍රකාශ කරන ලදී.

රට ගොඩ නැගීම සඳහා මෙලෙස ලේ පිපාසාවෙන් යුතුව කටයුතු නොකර, ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් නවතා දමා, සියලුම දෙනා එක්ව කටයුතු කළ යුතු බව ප්‍රකාශ කර සිටින ලදී.

❖ <u>ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතාගේ අදහස් දැක්වීම</u>

2022.05.09 වන දින ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා හමුවීම සඳහා අප ප්‍රදේශයේ ජනතාව ගිය හේතුවට එදින තිස්සමහාරාමයේ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සිදු කළද, මේවා පෙර සැලසුම් කර සිදු කරන ලද ක්‍රියාවන් ලෙස සඳහන් කළ යුතුය. එදින තම කොට්ඨාසයේ ස්වාමීන් වහන්සේ නමක් ජනතාවද පොළඹවා ගනිමින් තමාට ප්‍රහාරයක් එල්ල කිරීමට කටයුතු සැලසුම් කර තිබුණද, තමාගේ නිවසටත්, තම සහෝදරයාගේ නිවසටත් කිසිදු හානියක් නොවන ආකාරයට තම කොට්ඨාසයේ පිරිස ආරක්ෂාව ලබා දුන් බවත්, එම සියලුම පිරිසට මාගේ ස්තුතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදී. එසේම 05.09 වන දින තිස්සමහාරාමයේ සිදු කළ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සියල්ල ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ නියෝජිතයින් විසින් සිදු කළ ක්‍රියාවන් බවත් දන්වා සිටින ලදී.

මෙම අරගලය සඳහාත්, නිවෙස් කුඩු කර ගිණි බත් කිරීම සහ ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාගේ නිවසද කුඩු කිරීම සඳහා තරුණ පිරිසට අයිස් මත්ද්‍රව්‍ය, මත් වතුර ලබා දෙමින් පොළඹවා ඇත්තේ ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය විසින්ය. එසේම ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාගේ මාගම නිවසේ ඇති වී තොගයන්ද සොරා ගැනීමට එම පිරිස විසින් කටයුතු කර ඇත. මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් එක් දිනක සැලසුමක් නොවන බවත්, මෙය දීර්ඝ කාලීනව සැලසුම් කර සිදු කරන ලද ක්‍රියාවක් ලෙසත් හැඳින්විය හැකිය.

2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියවන් නිසා ගරු සභාපතිතුමාගේ සහ ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ සහ චතුමිණී දිල්ෂාණි විජේනායක මෙනවියගේ නිවෙස් සඳහා සිදු වූ හානියට මාගේ දැඩි කණගාටුව පල කරන ලදී. එසේම මෙම සිදුවීම දැඩි සේ හෙලා දකින බව ප්‍රකාශ කරන ලදී.

අප ආණ්ඩු පක්ෂයක් ලෙස ප්‍රදේශයට යම් සංවර්ධන කටයුත්තක් සිදු කරන්නේ, එය ආණ්ඩු පක්ෂයේ සාමාජිකයින්ට පමණක් නොව, ප්‍රදේශයේ සිටින සියලුම ජනතාවටය. එසේ අප සියලුම ජනතාව එක සේ සිතා කටයුතු කළත්, එලෙස කටයුතු කරන අප හටම ජනතාව විසින් ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සිදු කිරීමට සැලසුම් කිරීමත් කණගාටුවට කරුණකි.

1988/1989 වර්ෂ තුළද ජනතා විමුක්ති පෙරමුණ මූලික වෙමින්, ඇති වූ භීෂණ තත්ත්වයක්, වර්තමානයේ 05.09 වන දිනත් සිදු වූ බව කිව හැකිය. මෙම සිදුවීම් ගත් කළ රට තුළ කිසි කලක ජනතා විමුක්ති පෙරමුණ පාලනයක් උදා නොවේවායි ප්‍රාර්ථනා කළ යුතුය.

මෙම සිදුවීම මෙහෙයවන ලද මහ මොළකරුවන් මේ වන විට බියේ සැංගී ඇත. මේ සඳහා පොළඹවා ඇති පිරිස නීතියට අසු කර ගනිමින් සිටින බැවින්, මෙම ක්‍රියාව මෙහෙයවන ලද මහ මොලකරුවන් අනිවාරයෙන් නීතියේ රැහැනට අසු කර දීමට කටයුතු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී. එසේම මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාව මෙහෙයවන ලද ජනතා විමුක්ති පෙරමුණ නායක එල්.එච්. කුමුදු සුජීව මහතා නීතියේ රැහැනට අසු කර දිය යුතු බවත්, ඔහුට මෙහි එල විපාක නිසැකවම ලැබන බවත් සඳහන් කළ යුතුය.

වෙසක් මාසය තුළ සිදු කරන ලද මෙම පාපකාරී ක්‍රියාවන් හේතුවෙන් නිවෙස්වල තිබෙන බුදු පිළිම, බුදු පින්තූර විනාශ කර දැමීමට ද ප්‍රචණ්ඩකාරීන් විසින් කටයුතු කිරීමෙන් ඔවුන්ට දිට්ඨ ධම්මවේදී කර්මය අනිවාරයෙන්ම විඳීමට සිදු වන බව ප්‍රකාශ කරන ලදී.

සිදු කරන ලද මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් නිසා, අපගේ දේශපාලනය කිරීම නතර කරයි යනුවෙන් සිතන්නේ නම්, එය වැරදි දෙයකි. අපගේ හුස්ම පොද නැති වෙන තෙක් ජනතාව වෙනුවෙන් දේශපාලනය සිදු කරන බව දන්වා සිටින ලදී.

එසේම තිස්සමහාරාමයේ වංචනික ලෙස, ළමුන් සඳහා දේශපාලනය කිරීමට උගන්වන සියලුම උපකාරක පන්ති වහාම නවතා දැමීමට කටයුතු කළ යුතුය.

ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය විසින් සිදු කරන ලද ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් නිසා අප සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු ගරු සභිකයන්ට සිදු වූ විනාශකාරී ක්‍රියාවන්ට සම්බන්ධ සියලුම දෙනාට විපාක ලැබෙනු ඇත. එසේම ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය විසින් සිදු කරන කිසිදු කාර්යයක් සාර්ථක නොවේවායි කියා ප්‍රාර්ථනා කරන ලදී.

❖ <u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතාගේ අදහස් දැක්වීම</u>

අප සභාව තුළ ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය ඇතුළු අනෙක් පක්ෂවල සියලුම නියෝජිතයින්ට තමා එක සේ සමානව සලකා කටයුතු කරන ලදී. නමුත්, එසේ සලකා කටයුතු කළ ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේම නියෝජිතයින් අප හට මෙවැනි විනාශයක් සිදු කලේ යැයි අපට සිතා ගත නොහැකි බව දන්වා සිටින ලදී. අප දුක් මහන්සියෙන් සකස් ගත් අපගේ නිවාස, දේපළ, වාහන විනාශ කරමින් සිදු කරන ලද විනාශයන්, යම් දිනක මෙම විනාශකාරී සිදුවීමට සම්බන්ධ සියලුම දෙනාට ඉදිරියේ විපාක ලෙස ලැබෙනු ඇත.

අප ආයතනය විසින් ද යම් යම් අවස්ථාවල සහාය ලබා දී ඇති තිස්සමහාරාමයේ පවතින බොහෝ ෆිනෑන්ස් ආයතනවල නිලධාරීන්ද මෙම විනාශකාරී සිද්ධිය සඳහා සම්බන්ධ වී ඇත. එම සියලුම දෙනාටත් මෙම සිදුවීමට සම්බන්ධ වීමේ සාපය ලැබෙනු ඇත.

මෙකී විනාශකාරී සිදුවීම හේතුවෙන් මාගේ දරුවන් සහ බිරිඳ මේ දිනවල දැඩි මානසික තත්ත්වයකට පත්ව ඇත. අප පවුල් සඳහා මෙම විනාශකාරී සිදු කිරීම සිදු කරන ලද ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය විසින් මෙකී සිදුවීම සඳහා පාසල් යන දරුවන් සඳහා අයිස් මත්ද්‍රව්‍ය, වත් වතුර ලබා දී පෙළඹා යොමු කර ඇති බව ඉතාමත් පිළිකුල් සහගතව සඳහන් කළ යුතුය. ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය මූලිකත්වයෙන් උපකාරක පන්තිවල සිටින ගුරුවරුන් විසින් අධ්‍යාපන කටයුතු වෙනුවට දේශපාලනය උගන්වන බැවින්, එකී උපකාරක පන්ති වහාම නතර කර දැමිය යුතු බවට අතිගරු ජනාධිපතිතුමාටත්, අධ්‍යාපන අමාත්‍යතුමා වෙත ලිපියක් මගින් දන්වා යැවිය යුතුය.

තම නිවසට ගල් ගසා නිවස කුඩු කරන අවස්ථාවේ මාගේ රෝගී තත්ත්වයෙන් සිටි දරුවා වැද වැටෙමින් නිවස කුඩු කර නොදමන ලෙස අප සභාවේ ගරු සභිකයෙක් ලෙස සිටින එල්.එච්. කුමුදු සුජීව මහතාට ආයාචනා කළත්, ඔහු ඇතුළු මෙම ප්‍රචණ්ඩකාරී මිනිසුන් මාගේ නිවස විනාශ කර දමා ගොස් ඇත. එම සිදුවීම නිසා මාගේ දරුවන් මේ වන විටත් සිටින්නේ දැඩි පීඩනයකින්ය.

ජනතා විමුක්ති පෙරමුණ විසින් මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාව සඳහා අසරණ පාසල් ළමුන් පොළඹවා ගෙන තිබුණද, එම දරුවන්ගේ දෙමාපියන් විසින් දරුවන් නිදහස් කර දෙන ලෙස මාගෙන් ඉල්ලීම් කරනු ලබයි. මෙම ක්‍රියාව සම්බන්ධ මහ මොලකරුවන්, පිනැන්ස් ආයතන නිලධාරී, උපකාරක පන්ති ගුරුවරුන් නීතියේ රැහැනට අසු කර දීමට අනිවාරයෙන්ම කටයුතු සිදු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

එසේම මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාව මෙහෙයවීමේ කටයුතු කළ ගරු සභික, එල්.එච්. කුමුදු සුජීව මහතා අනිවාරයෙන්ම නීතියේ රැහැනට අසු කර දිය යුතු බවත්, මෙම සිදු වී විනාශකාරී සිදුවීම් සියල්ලෙහිම විපාකය අනිවාරයෙන්ම ඔහුට මෙලොවදීම විදීමට සිදුවන බවත් ප්‍රකාශ කරන ලදී.

තිස්සමහාරාම පුරවරය ලේ විලක් බවට පත් වීමට ඉඩ නොදී, ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්වලට පෙළඹවීම් සිදු නොකර, මතවාදී දේශපාලනයක් සිදු කරන ලෙසට සියලුම දෙනාගෙන් ඉල්ලා සිටින ලදී.

අද දින මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්ට හා මාධ්‍යවේදීන් දෙපල, ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්මියටත්, ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ස්තුතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව. 02.00 ට පමණ මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වාර්තා කළේ - ඩී. රුවිනා දීපානි,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

සභාපති,
ඩබ්ලිව්.ජී. උපුල්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2022.05.17 දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.